**ශීර්ෂය - 430 ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2020 සැප්තැම්බර් 01 දින ආරම්භ කර තිබුණු බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් අමාත්‍යාංශය සතු වාහන 12 ක් මෙම අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබා දී තිබුණ ද ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද 2021 පෙබරවාරි මස ඉන් වාහන 05 ක් නැවත ඉඩම් අමාත්‍යාංශය වෙතද, වාහන 7ක් පළාත් පාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය වෙතද පවරා දි තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමග එකඟ වේ. | රාජ්‍ය අමාත්‍යාංශය සතු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති 01 හා 02 ට අදාළව පුනරාවර්තන වැය විෂයයන් 19 ක එකතුව රු.25,298,106 ක්වූ ඉතිරිවීම් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 9 ක එකතුව රු.2,806,752 ක්වූ ඉතිරිවීම් පැවතුණි. මෙම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණය නිවැරදිය. අමාත්‍යාංශය 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 ගැසට් නිවේදනය අනුව ස්ථාපිත කරනු ලැබූ අතර, කාර්ය මණ්ඩලය අනුමත කරනු ලැබුවේ 2020 සැප්තැම්බර් 04 දිනයි. ඒ වන විට අමාත්‍යාංශ කාර්යභාරය පැහැදිලි කර ගැනීමටත් විෂය වෙන් කර ගැනීම හා වැඩසටහන් හඳුනා ගැනීම අවසන් කිරීමට නොහැකි වූ බැවින් ඉඩම් අමාත්‍යාංශය භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර දළ වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර ඇත. ඒ සඳහා මෙම අමාත්‍යාංශය අදහස් විමසීමක් සිදු කිරීමට තරම් සූදානම් තත්ත්වයක නොතිබුණි. එම නිසා වෙන් කළ ප්‍රතිපාදනවල ඉතිරිවීම් සිදු වී තිබේ. | වර්ෂයට අදාළ වැයකිරීම් සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදනයන් අරමුණුගත කාර්යයන් ඉටු කර ගැනීම සඳහා සකසුරුවම් ලෙස වැය කළ යුතු වේ. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයකට හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 කට අදාළව මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන්වලින් මාරු කරගෙන තිබුණු එකතුව | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ ප්‍රවාහන දීමනාව ලබමින් සිටි මාධ්‍ය ලේකම් දෙසැම්බර් මස මැද ඉල්ලා අස්වීම, නව අමාත්‍යාංශයේ අංශ වෙන් කිරීම් සඳහා මු.රෙ. 66 යටතේ | වර්ෂයට අදාළ වැයකිරීම් සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදනයන්ට අමතරව වෙනත් වැය විෂයයන්ගෙන්ද අරමුණුගත කාර්යයන් ඉටු කර ගැනීම |

| | | |
|---|---|---|
| රු.1,050,000 ක්වූ ප්‍රතිපාදනවලින් රු.222,331 ක් හෙවත් සියයට 21 ක් ඉතිරි කර තිබුණි. | ප්‍රතිපාදන ලබා ගැනිමේදී කාර්මික නිලධාරි ඇස්තමේන්තුව පදනම් කර ගෙන ඉල්ලුම් කළද කොවිඩ් වසංගත තත්ත්වය මත කටයුතු අවසන් කර වර්ෂය අග භාගයේ ගෙවීම් කිරීමේදී ඉටුකළ කාර්ය පදනම් කරගෙන සකස් කළ අවසාන බිල්පත මත ගෙවීම් කිරීම, කොවිඩ් වසංගත තත්ත්වය තුළ භාණ්ඩ මිලදී ගැනීමේදී ඇතැම් අයිතම සඳහා තොග නොමැති තත්ත්වයක් මත කටයුතු කිරීමට සිදුවීම නිසා මුළු ප්‍රතිපාදනයෙන් සියයට 1 ක් පමණ ඉතිරිවීම යන කරුණු මෙම ඉතිරිවීම්වලට හේතු විය. | සඳහා කරන ලද මාරුකර ගැනීම් සකසුරුවම් ලෙස වැය කළ යුතු වීම. |

## 2.7 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත ප්‍රතිපාදන ඉක්මවා පුනරාවර්තන වැය විෂයයන් 03 කට අදාළව රු.155,416 ක බැරකම්වලට එළඹ තිබුණි. | 2020 වර්ෂයේ සියලු කාර්යයන් මාස 04ක් වැනි කෙටි කාලයක් තුළ ඉටු කිරීමේදී ගෙවීම් වවුචර් ඒ ඒ මාසය තුළ ඉදිරිපත් නොවූ අතර, බොහොමයක් වවුචර්පත් 2020 දෙසැම්බර් මස අවසන් දින කිහිපය තුළ ඉදිරිපත් විම නිසා ඒ ඒ වැය විෂයන්ගේ ප්‍රතිපාදන අවශ්‍යතාවය පුරෝකථනය කිරීම අපහසු විය. 2021 පෙබරවාරි 16 දින මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය ඉඩම් | අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම්වලට එළඹීමට කටයුතු නොකළ යුතු වේ. |

අමාත්‍යාංශයට එකතු කිරීම සමඟම රාජ්‍ය අමාත්‍යාංශයේ ඒ දක්වා සියලු බැරකම් ගෙවා 2021 මාර්තු 31 දිනට අවසන් කරන ලෙස උපදෙස් ලබාදෙන ලද බැවින් 2020 වර්ෂයේ පුනරාවර්ථන වැය විෂයන්ගේ ඉතිරිවීම් ඉක්මවා නොයන පරිදි වැය දරා අවසන් කරන ලදී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 19 දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පිහිටුවා තිබුණු මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2021 පෙබරවාරි 16 දිනැති අංක 2215/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අහෝසි කර තිබුණු බැවින්, එම කාලසීමාව තුළදී රු.26,118,666 ක් වැය කර තිබුණද අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කිරීමට හැකියාවක් නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණ සමග එකඟ වේ. | රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණුගත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ඉලක්ක කරගත් දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කළ යුතුය. |